දෙහිඕවිට ප්‍රාදේශීය සභාව,

කෑගල්ල දිස්ත්‍රික්කය

------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ජූලි 14 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක දිනට ලැබියයුතු උසාවි දඩ ආදායම් රු.6,640,659 ක් වුවත් එය රු.7,697,925 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට ආදායම් ණයගැතියන් හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.1,057,266 බැගින් වැඩියෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් ප්‍රභවයන් 11 ක් යටතේ ලැබී තිබුණු රු.128,170,707 ක් හා ලැබියයුතු රු.4,199,637 ක් ප්‍රාග්ධන ආධාර තැන්පත් ලැබීම් හා තැන්පත් ගෙවීම් යටතේ ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් රු.132,370,344 ක් අඩුවෙන් ද 2016 දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියන් හා ණයහිමියන් රු.4,199,637 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) මුද්දර ගාස්තු උපලේඛන පිළියෙල කිරීම වෙනුවෙන් 2015 වර්ෂයට අදාලව ඒකක 1,001 වෙනුවෙන් රු.100,100 ක් හා සමාලෝචිත වර්ෂයේ මාස 06 කට අදාලව ඒකක 629 ක් වෙනුවෙන් රු.62,900 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන සිදු නොකිරීම නිසා ණයහිමියන්

රු.163,000 ක් අඩුවෙන්ද සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.100,100 ක් සහ වර්ෂයේ අතිරික්තය රු.62,900 ක් වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2015 වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා රු. 29,366 ක අධි වෙන්කිරීම නිවැරදි කිරීමට කටයුතු නොකිරීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් රු.29,366 ක් වැඩියෙන් හා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.

(ඉ) තල්දූව පොදු වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් 2015 ජූනි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.131,250 ක පොලී මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කිරීම නිසා අතිරික්තය රු.131,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 02 කට අදාල මූලා ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 3,570,333 ක් වූ අතර,ඊට අදාල උපයෝගී ලේඛන/වාර්තා අනුව ශේෂයන්ගේ වටිනාකම රු. 1,439,519 ක් වූයෙන් රු. 2,130,814 ක වෙනසක් විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම</u>

2009 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු.4,552 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 <u>ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010/2011 වර්ෂ වලදී රැස්කළ එකතු කළ අගය මත බදු, ජාතිය ගොඩනැගීමේ බදු හා රඳවා ගැනීමේ බදු එකතුව රු. 3,015,033 ක් 2017 මැයි 31 දින වනවිටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

(ආ) 1989 හා 1992 වර්ෂවල සිට පැවත එන හිඟ කසළ බදු, වෙළඳපොල කඩකුලී හා දඩ, මස්කඩ, මාළුකඩ හා දඩ එකතුව රු.102,679 ක් අයකර ගැනීමට කටයුතු කිරීමෙන් තොරව ලැබියයුතු ශේෂය යටතේ දක්වා තිබුණි.

1.3.5 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම</u>

පහත දැක්වෙන නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | -------------------------------------- | ----------------------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) වගන්තිය | 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,843,403 ක් වූ හිග වරිපනම් බදු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ.371 (2) ආ | අවස්ථා 03 කදී ලබාදෙන ලද එකතුව රු. 220,000 ක් වූ අත්තිකාරම් 11 ක් 2016 දෙසැම්බර් 31 දින වනවිටත් පියවා නොතිබුණි. |
| (ii) | මු.රෙ. 396 (ඇ) | නිකුත් කල නමුත් මාස 06 ක් ඉක්මවා ගෙවීමට ඉදිරිපත් නොකල එකතුව රු. 182,825 ක් වූ චෙක්පත් 14 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iii) | මු.රෙ. 571 | 2006 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාලව එකතුව රු. 5,873,944 ක් වූ තැන්පත් 400 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (iv) | මු.රෙ.880 සිට 893 දක්වා | ඇප තැබිය යුතු නිලධාරින් 07 දෙනෙකුගෙන් රු.29,000 ක සේවක ඇප ලබාගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (v) | මු.රෙ. 1646 | දෛනික ධාවන සටහන් හා සාරාංශ ඊලඟ මාසයේ 15 දිනට ප්‍රථමයෙන් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත් සභාව සතු වාහන 17 ක් සඳහා මාස 01 සිට මාස 12 දක්වා කාලයකට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදයේ 1.6 වගන්තිය | සභාවේ සේවයේ නියුතුව සිට වැඩ තහනමට ලක්වූ හා ස්ථාන මාරුවීම් ලබාගිය සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.75,907 ක ණය ශේෂය අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන ලේකම් ගේ අංක 01/2004 හා 2004 ජනවාරි 26 දිනැති චක්‍රලේඛය | ක්ෂේත්‍ර නිලධාරින් දෙදෙනෙකු විසින් මාස 09 ක් සඳහා ඉදිරි වැඩසටහන් හා මාස 11 ක් සඳහා පසු වැඩසටහන් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | සබරගමුව පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් ගේ 2010 නොවැම්බර් 16 දිනැති අංක 10/2010 දරන චක්‍රලේඛය | අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ සහන පදනමින් කිසිදු සේවකයකු ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියකින් තොරව බඳවා නොගත යුතු වුවත් එවැනි අනුමැතියකින් තොරව තනතුරු වර්ග 02 ක් සඳහා සේවකයන් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිපලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.15,806,397 ක් වූ අතර,ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.13,493,328 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිපලයේ රු.2,313,069 ක වර්ධනයක් දක්නට ලැබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,313,069 ක වර්ධනයට ආදායම් විෂයයන් 06 ක වැඩිවීම හා වියදම් විෂයයන් 3 ක අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම,තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2016.01.01 දිනට හිඟය | 2016.12.31 දිනට හිඟයෙන් අයකිරීම | 2016 වර්ෂයේ බිල් කිරීම | වර්ෂයේ බිල් කිරීම් වලින් අයවීම | 2016.12.31 දිනට හිඟය<br>2016.01.01 දිනට පැවති හිඟයෙන් හිඟ | <br>වර්ෂයේ බිල් කිරීම් වලින් හිඟය | මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 6,391 | 1,877 | 3,552 | 2,198 | 4,514 | 1,354 | 5,868 |
| (ii) බදු කුලී | 615 | - | 4,302 | 2,868 | 615 | 1,434 | 2,049 |
| (iii) බලපත්‍ර ගාස්තු | 115 | 16 | 683 | 683 | 99 | - | 99 |
| (iv) වෙනත් ආදායම් | 18,301 | 13,533 | 43,793 | 22,738 | 4,768 | 21,055 | 25,823 |
| එකතුව | 25,422 | 15,426 | 52,330 | 28,487 | 9,996 | 23,843 | 33,839 |

2.3.2 වරිපනම් බදු

----------------

වරිපනම් දේපල අවම වශයෙන් වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කර බදු අයකලයුතු වුවත් 2008 වර්ෂයේ සිදු කරන ලද තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී වරිපනම් බදු අයකර තිබුණි.

2.3.3 වෙනත් ආදායම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) පරිසර ආරක්ෂණ බලපත්‍ර

2000 අංක 53 හා 1988 අංක 56 දරන පනත් මඟින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත 1533 / 16 හා 2008 ජනවාරි 25 දිනැති විශේෂ ගැසට් නිවේදනය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාරික ආයතන 06 ක් විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගැනීම නිසා සභාවට රු.24,000 ක ආදායමක් අහිමිව තිබුණි.

(ආ) දැන්වීම් පුවරු ගාස්තු

---------------------

ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු අයකිරීමට අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොතිබුණු අතර තාවකාලික දැන්වීම් පුවරුවක් සඳහා රු.10 ක් හා ස්ථාවර ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා රු.50 ක් බැගින් ගාස්තු අයකරතිබුණි.

(ඇ) ඉඩම් විකිණීම මත ගාස්තු

-----------------------------

2015 හා 2016 වර්ෂ වලදී ඉඩම් 05 ක් කට්ටිකර විකිණීමට අදාල තක්සේරු වටිනාකම මත සියයට 01 ක ගාස්තු ලෙස රු. 877,455 ක් තැන්පත් ලෙස අයකරගෙන තිබූ නමුත් ඉඩම් කට්ටිවල සත්‍ය විකුණුම් වටිනාකම මත සියයට 01 කට සමාන ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඇ) දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු

----------------------------------------------------------

සභා බල ප්‍රදේශය තුල ඉදිකර තිබුණු දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 02 කින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1597/ 8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව රු.49,000 ක පෙරසැරි ගාස්තු අයකර ගෙන නොතිබුණි.

(ඉ) ව්‍යාපාර බදු

------------

සභා බල ප්‍රදේශය තුල පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර, වෘත්තීන් හා කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර නොතිබුණ අතර ව්‍යාපාර ආයතන 08 ක් සඳහා ව්‍යාපාර බදු නොගෙවීම මත රු.24,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

2.3.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට ලැබියයුතුව තිබුණු උසාවි දඩ ආදායම රු.13,095,634 ක් හා මුද්දර ගාස්තු ආදායම රු.10,200,000 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 කාර්යසාධනය

------------------

සභාවට අයත් සුසාන භූමි පිළිබඳ විස්තර සභාව සතුව නොතිබුණු අතර පරිත්‍යාග හා පැවරුම් ලෙස සභාවට ලබාදී තිබූ භූමි නීත්‍යානුකූල ඔප්පු මඟින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) තනතුරු වර්ග 06 ක සේවකයින් 12 දෙනෙකුගේ පුරප්පාඩු හා තනතුරු වර්ග 03 ක සේවකයින් 06 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.

(ආ) ධාවනයේ යෙදෙන වාහන 15 ක් සඳහා රියදුරන් 08 දෙනෙකු සේවයේ යොදවා තිබීම හේතුවෙන් සභාවේ වාහන ඌන උපයෝජන තත්ත්වයක පැවතුණි.

(ඇ) සභාවේ ප්‍රයෝජනයට ගන්නාලද වාහන 11 ක හා ට්‍රේලර් 02 ක අයිතිය සභාව නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) දෙහිඕවිට නගර සංවර්ධන වැඩසටහන යටතේ සභා අරමුදලින් මිලදී ගන්නා ලද බුල්ලෝ යන්ත්‍රයට අදාල රු.188,000 ක මුදල ලේඛනවල අඩුපාඩු හේතුවෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ඉ) 2015 නගර සංවර්ධන සැළැස්ම යටතේ ප්‍රාදේශීය සභාව සහ පොදු වෙළඳ සංකීර්ණයේ CCTV කැමරා පද්ධතිය සවිකිරීම සඳහා රු. 882,900 ක් 2016 ජනවාරි 27 දින ගෙවා තිබුණු නමුත් එහි පැවති අඩුපාඩු 2017 ජනවාරි වන විටත් සකස්කර නොතිබුණි.

(ඊ) 2017 ජනවාරි 06 දින විදුලි උපකරණ හා භෞතික තොග පරික්ෂාවේදී භාණ්ඩ වර්ග 04 ක ඒකක 14 ක ඌනතාවයක් වාර්තා කර තිබුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක් බදු දීමේදී ගිවිසුම් වලට එළඹ නොතිබුණ අතර රු.11,150,000 ක එක්වන් මුදල් (key money) අයකරගෙන නොතිබුණි.

(ආ) සභාවේ පොදු වෙළඳපොල කඩ කාමර බදු දීමේදී බදුකරුවන් 14 දෙනෙකු ගෙන් අයවිය යුතු කඩ කාමර කුලී රු.1,966,800 ක් හා දඩ රු.214,795 ක් ලෙස එකතුව රු.2,181,595 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 නිශ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

-------------------------------------

සභාව සතු කැබ් රථ දෙකක් , ට්‍රැක්ටර් රථයක් හා පීඩන තලනයක් පිළිවෙලින් 2015 ,2010 හා 2014 වර්ෂවල සිට අක්‍රියව පැරණි සභා භූමිය තුල නිෂ්කාර්යව පැවතුණි.

3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කසල රැස්කිරීමේ මධ්‍යස්ථාන දෙකක් සතිපොල භූමියේ හා දීගල්ලවත්ත ප්‍රදේශයේ පවත්වාගෙන ගොස් තිබියදී දෛනිකව එක්රැස් කරනු ලබන කසල ප්‍රාදේශීය සභා සංකීර්ණය අසල රැස්කිරීම හේතුවෙන් නගර වැසියන්ගේ විරෝධතාවය දැක්වීම නිසා එකී කසල ඉවත්කිරීම සඳහා රු.2,792,400 ක පිරිවැයක් දරා තිබුණි.

(ආ) 2016 ඔක්තෝබර් සිට කසල කළමනාකරණ ව්‍යාපෘතියක් දීගල්ලවත්ත ප්‍රදේශයේ පවත්වාගෙන යන අතර ප්‍රතිචක්‍රීයකරණය කල නොහැකි ප්ලාස්ටික් වැනි අපද්‍රව්‍ය වලක් කපා බහාලීම සිදු කර තිබුණි.

4 <u>ගිණුම් කටයුතු භාවය හා යහපාලනය</u>

4.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මැයි 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 <u>අයවැය පාලනය</u>

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයන් 08 ක එකතුව රු. 2,517,000 ක ප්‍රතිපාදන සියයට 100 ක් හා වැය විෂයන් 04 කට අදාල ප්‍රතිපාදන වලින් සියයට 68 ත් සියයට 96 ත් අතර ප්‍රතිශතයකට සමානව රු. 3,015,319 ක් උපයෝජනය කර නොතිබුණි.

4.3 අභ්‍යන්තර විගණනය

-------------------------

1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 5(7) රීතිය ප්‍රකාරව මුල්‍ය හා ගබඩා සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

5. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) අත්තිකාරම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන නොකිරීම |
| | | (ii) අවිනිශ්චිත ගිණුමේ දිගුකාලයක සිට පවතින ශේෂය නිරවුල් නොකිරීම |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) වරිපනම් සඳහා දේපල තක්සේරුව නියමිත පරිදි නොකිරීම |
| | | (ii) හිග ආදායම් අයකර ගැනීමට නීතිමය කටයුතු නොකිරීම |
| | | (iii) ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ නොපැවැත්වීම |
| (ඇ) | අයවැය පාලනය | (i) ඇස්තමේන්තු ප්‍රතිපාදන වල සැලකිය යුතු ඉතිරියක් තිබීම |
| | | (ii) ඇස්තමේන්තුගත ආදායම් අයකර නොගැනීම |
| (ඈ) | වාහන පාලනය | (i) දෛනික ධාවන සටහන් ඉදිරිපත් නොකිරීම |
| | | (ii) වාහන වල ඉන්ධන පරික්ෂාව සිදු නොකිරීම |